**යාපනය විශ්වවිද්‍යාලය - 2015**

------------------------------------

යාපනය විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට යාපනය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට (ශ්‍රීලංරාගිප්‍ර) අනුකූලවීම

---

**ශ්‍රීලංරාගිප්‍ර 7 - දේපල, පිරියත හා උපකරණ**

---

පෙර වර්ෂවලදී රු.4,633,615 ක පිරිවැයකට විශ්වවිද්‍යාලය විසින් ප්‍රසම්පාදනය කරන ලද හා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කිරීමෙන් තොරව හා ප්‍රමිතියේ 65 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වෙනස්කම් ගිණුම්ගත කිරීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරමින් පැවතුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂය තුළ ලැබී තිබූ රු.28,300 ක් වටිනා ගබඩා විෂයයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) කෘෂිකර්ම පීඨයේ ඉදිකරන ලද ගොඩනැඟිල්ල සඳහා උපදේශකවරයාට ගෙවන ලද රු.5,025,466 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැඟිලි ගිණුමට අය කිරීම වෙනුවට උපදේශක සේවා ලෙස සාවද්‍යව දක්වා තිබුණි.

#### 2.2.3 අවිනිශ්චිත ගිණුම

---

රු.333,885 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2012 වර්ෂයේ සිට අවිනිශ්චිත ගිණුමේ දක්වා තිබුණි. 2014 අගෝස්තු 14 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කමිටු රැස්වීමේදී උපකුලපතිවරයා විසින් පාලක සභාවේ අනුමැතිය සහිතව මෙම කරුණ ඉතා ඉක්මනින් පැහැදිලි කර ගැනීමට එකඟවූ නමුත්, අදාළ අධිකාරීන් විසින් 2016 සැප්තැම්බර් 30 වන විටත් මේ සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

#### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 7 කට වැඩි කාලයක් හිඟව පැවතුණු රු.84,240 ක් වූ ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හෝ ලියාහැරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. එසේම මූල්‍ය ප්‍රකාශනවල අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයක්ද කර නොතිබුණි.

(ආ) රු.981,957 ක් වූ අත්තිකාරම් වර්ෂ 7 කට වැඩි කාලයක් හිඟ ශේෂයන්හි ඇතුළත් කර තිබූ අතර එම අත්තිකාරම් අයකර ගැනීම සඳහා මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) හැරු ළිඳ සහිත පොම්පාගාර ජල ටැංකිය, වෛද්‍ය පීඨය සඳහා ශ්‍රවනාගාරය ඉදිකිරීම් සහ කලා පීඨය සඳහා ඇතුල්වීම් ව්‍යුහය නවීකරණය කිරිම ( කයිලාසපති ශ්‍රවණාගාරය) වවුනියා මණ්ඩපයේ ව්‍යවහාර විද්‍යා පීඨයේ III අදියර ඉදිකිරීම, ව්‍යාපාර අධ්‍යයන පීඨය, වවුනියා මණ්ඩපයේ ආපන ශාලාව සහ වවුනියා විවිධ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම ආදී විවිධ ව්‍යාපෘති වැඩ සඳහා ගෙවන ලද එකතුව රු.41,157,244 ක් වූ අත්තිකාරම් ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ සිට නිරවුල් කර නොතිබුණි.

(ඈ) පොත් හා වාර සඟරා සැපයීමට සහ විවිධ කාර්යයන් සඳහා 2010 වර්ෂයේ සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ ගෙවන ලද එකතුව රු.5,830,953 ක් වූ අත්තිකාරම් 2016 ජුලි 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඉ) පුනරුත්ථාපන වැඩ සඳහා 1999 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 22 කදී එකතුව රු.735,501 ක් වූ විවිධ අත්තිකාරම් ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. වැඩ නිම කර තිබුණද, ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව විසින් 2016 සැප්තැම්බර් දක්වා මෙම අත්තිකාරම් විශ්වවිද්‍යාලයට නිරවුල් කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පරිත්‍යාග ලැබීම්, වාහන අනතුරු හේතුවෙන් දරන ලද පාඩු හා හානි, පර්යේෂණ දීමනා ගෙවීම, නේවාසිකාගාර කුලී ආදායම, නිරවුල් නොකළ අත්තිකාරම් ආදී ගිණුම්වල දැක්වෙන පහත සඳහන් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

- විදේශ රටවල් / තානාපති කාර්යාල වලින් ලැබුණු පරිත්‍යාග පිළිබඳ විස්තරාත්මක වාර්තා
- විශ්වවිද්‍යාල සනාථන සභාවේ, මුදල් කමිටුවේ , පීඨවල හා පුස්තකාලයේ රැස්වීම්වල සටහන්
- අධ්‍යයන වැඩ සටහන් පිළිබඳ විස්තර
- අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් නිම කරන ලද පර්යේෂණ පිළිබඳ විස්තර

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය | |
| (i) IX පරිච්ඡේදයේ 4.3 වගන්තිය | අතිකාල සඳහා අදාළ වේලාවන් සටහන් කිරීම සඳහා වෙනම ලේඛනයක් පැවැත්විය යුතු වුවද වවුනියා මණ්ඩපයේ එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | සියලු වැටුප් රහිත නිවාඩු පිළිබඳව මාසිකව පොදු ආකෘති 96 මගින් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |

(iii) XXII පරිච්ඡේදයේ 11.1 වගන්තිය

රු.1,572,450 ක වංචනික ගෙවීම් සඳහා වගකිව යුතු පුද්ගලයෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම හා චෝදනා පත්‍ර නිකුත් කිරීම වර්ෂ 2 මාස 8 ක් ඉකුත් වී තිබුණද නිමකර නොතිබුණි. අදාළ පුද්ගලයාගෙන් පාඩුව අයකර ගැනීම සඳහා මූල්‍ය බලතල උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට පැවරී ඇති බව මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා විසින්, දන්වා තිබුණි.

(iv) XXVI පරිච්ඡේදයේ 2, 3 හා 4 වගන්ති

උසස් අධ්‍යාපන ආයතනවලට අයත් සියලු භාණ්ඩ හා ස්ථාවර වත්කම් පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකළ යුතුය. කෙසේ වුවද, රු.26,388,415 ක් වටිනා පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණය කර අදාළ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

(v) XXVII පරිච්ඡේදයේ 3.1 වගන්ති

පොදු ව්‍යාපාර කාරක සභාව විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට හා ගණන්දීමේ නිලධාරියාට පැමිණීමේ ලේඛනය නියමිත වේලාවට වැසීම සඳහා නියෝගයක් ලබාදී තිබූ නමුත් එම නියෝගයට අනුකූලවී නොතිබුණි.

**(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන චක්‍රලේඛය

විශ්වවිද්‍යාලයේ පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ**

(i) 2014 අප්‍රේල් 24 දිනැති අංක 2/2014

රැස්වීම් වලට සහභාගීවීම වෙනුවෙන් පාලක සභා සාමාජිකයන්ට සමාලෝචිත වර්ෂය තුළ රු.560,000 ක මුදලක් උපයනවිට ගෙවීම් බදු අයකිරීමෙන් තොරව ගෙවා තිබුණි.

(ii) 2010 පෙබරවාරි 15 දිනැති අංක 02/2010

ඇඟිලි සටහන් ස්කෑනර් යන්ත්‍රය මඟින් පැමිණීම හා පිටවීම් වේලාව සනාථ කර ගැනීමෙන් තොරව වවුනියා මණ්ඩපයේ අධ්‍යයන හා අනධ්‍යයන සේවකයන් 138 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ රු.62,219,455 ක මුදලක් ගෙවා තිබුණි.

**(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

(i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90

වාහනවල ඉන්ධන පරිභෝජනය අවම වශයෙන් මාස 06 කට වරක් පරීක්ෂා කළ යුතුය. කෙසේ වුවද විශ්වවිද්‍යාලයට අනුයුක්ත වාහන 17 කට අදාළව මෙම පරිපාටිය සිදුකර නොතිබුණි.

(ii) 2015 මැයි 20 දිනැති අංක 11/2015 — නියමිත ඇඳුම් පැළඳීමෙන් තොරව විශ්වවිද්‍යාලයේ ඇතැම් කාර්ය මණ්ඩලය කාර්යාලයට පැමිණ තිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 136(6) | අධිකාරී බලයලත් පුද්ගලයන්ගේ වාර්තා සටහන් සහතික කිරීමේ නිලධාරියාගේ වාර්තා සමඟ අවම වශයෙන් මාසයකට වරක් හෝ සසඳා පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 140(3) | එකතුව රු.1,572,450 ක් වූ වංචනික ගෙවීම් වවුචර් 6 ක් සම්බන්ධයෙන් ගෙවීම සිදුකිරීමට පෙර මූල්‍යාධිකාරී හට ඔහුගේ විශේෂිත දැනුම තුළ කිසිදු කරුණක් පිරික්සා බැලීමට හා විධිමත්ව කටයුතු කිරීමට නොහැකිවී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 272(1) | ගෙවීම් වවුචර් අදාළ වන මාසයේ අවසානයේ සිට සති 6 ක් ගතවීමට පෙර කිසිඳු ගෙවීම් වවුචරයක් මාසිකව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1645 | එක් එක් වාහනය මඟින් සිදුකරන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශ හා සෑම මාසයක් සඳහා දෛනික ධාවන සටහන් වාර්තා වාහන භාර නිලධාරියා විසින් අදාළ ආයතන ප්‍රධානියා මඟින් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 මැයි 06 දිනදීය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.141,526,367 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.124,793,315 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,733,052 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. පුද්ගලික පඩිනඩි, නඩත්තු වියදම්, ගිවිසුම්ගත සේවා සහ වෙනත් මෙහෙයුම් වියදම් වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.141,526,367 ක ඌනතාවයක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයෙන් රටට වූ දායකය රු.1,645,286,670 ක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂය අවසානයට හා පෙර වර්ෂ 4 ක් සඳහා අගය එකතු කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| ---------- | ------ | ------- | ------- | ------- | ------ |
| | රු. | රු. | රු. | රු. | රු. |
| වර්ෂය සඳහා ඌනතාවය | (141,526,367) | (124,793,315) | (119,128,668) | (100,783,982) | (60,290,341) |
| එකතු කළා - | | | | | |
| පුද්ගලික පඩිනඩි | 1,379,464,219 | 1,054,344,200 | 885,523,611 | 724,336,180 | 637,669,183 |
| රජයට ගෙවන ලද බදු | | | | | |
| - රේගු බදු | 132,569 | 220,641 | 437,504 | 46,704 | - |
| - එකතු කළ අගය මත බදු (VAT) | 68,249,939 | 59,818,383 | 25,818,383 | 10,940,557 | 2,923,767 |
| - වරාය අධිකාරීය බදු (PAL) | - | 396,526 | 673,318 | 192,121 | - |
| - වරිපනම් හා බදු | 1,624,121 | 1,663,868 | 1,189,326 | 905,219 | 844,689 |
| ක්ෂය | 195,815,822 | 156,616,277 | 115,530,639 | 93,580,287 | 67,246,092 |
| මුළු දායකය | 1,645,286,670 | 1,273,059,895 | 1,029,172,781 | 830,001,068 | 708,683,731 |
| අගය එකතු කිරීම | 1,503,760,303 | 1,148,266,580 | 910,044,113 | 729,217,086 | 648,393,390 |

සමාලෝචිත වර්ෂය තුළ පුද්ගලික පඩිනඩි හා ක්ෂය පිළිවෙලින් රු.325,120,019 කින් හා රු.39,199,545 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂය සඳහා අගය එකතු කිරීමෙහි රු.355,493,723 ක වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**
**--------------------------**

**4.1 කාර්ය සාධනය**
**----------------**

සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි විය.

**(අ) විභාග ප්‍රතිඵල**
**-----------------**

1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, විභාගය පවත්වා මාස තුනක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතුය. කෙසේ වුවද විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයන් යටතේ පවත්වන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීමේ දිනයන් හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ දිනයන් තීරණය කර නොතිබුණි. 2014 හා 2015 වර්ෂයන් තුළ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම, කලා , කළමනාකරණ අධ්‍යයන හා වාණිජ, විද්‍යා පීඨයන්හි හා බාහිර විභාග ඒකකයෙහි විභාග පැවැත්වීමේ දිනයේ සිට ප්‍රතිඵල නිකුත් කිරීමේ දිනය දක්වා මාස 4 සිට මාස 7 දක්වා සැලකිය යුතු කාල පරිච්ඡේදයක ප්‍රමාදයන් තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. එමඟින් නියමිත කාලය තුළදී ශිෂ්‍යයින්ට රැකියා අවස්ථාවන් ලබාගැනීමේ හැකියාව අහිමි කර තිබුණි. මෙම කරුණ මාගේ පෙර වර්ෂ විගණන වාර්තාවලින්ද පෙන්වාදී තිබුණද, ඉහත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා අදාළ අධිකාරීන් විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

----------------------

විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව හා සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 3 ක් සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | **2015** | **2014** | **2013** | **2012** |
|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.) | 1,258,378,949 | 988,640,662 | 815,147,732 | 644,212,414 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 8,307 | 8,308 | 5,723 | 5,896 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු.) | 151,484 | 118,999 | 142,433 | 109,262 |

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.32,485 කින් හෙවත් සියයට 27.29 කින් වැඩිවී තිබූ නමුත් මෙම වර්ෂ දෙක සඳහාම විශ්වවිද්‍යාලයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව එක හා සමානව පැවතුණි.

**(ඇ) පර්යේෂණ ආධාර හා පර්යේෂණ දීමනා ගෙවීම්**

**-----------------------------------------------**

පර්යේෂණ ආධාර හා පර්යේෂණ දීමනා පිළිවෙලින් රු.8,895,019 ක් හා රු.62,845,674 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආධාර ලබාගත් නිලධාරීන් නියමිත කාල පරිච්ඡේදය තුළ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීම සඳහා වැඩ සැලසුම් හා උපලේඛන නිලධාරීන් විසින් ලබාදී නොතිබුණි.

(iii) පර්යේෂකයින් විසින් නියමිත කාල පරිච්ඡේදය තුළ පර්යේෂණ ආධාර උපයෝජනය කර නොතිබුණි.

(iv) පර්යේෂණ දීමනා පිළිබඳ නියාමන පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් දුර්වලතා**

**--------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දැනට අලුත් වැඩියා කෙරෙමින් පවතින අමුත්තන් සඳහා නිවසක් විශ්වවිද්‍යාලය සතුව යාපනයේ පැවතුණි. කෙසේ වුවද අමුත්තන්ගේ නිවාසයේ අලුත්වැඩියා කටයුතු නිම කිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව, විශ්වවිද්‍යාලයට බැහැරින් පැමිණෙන නිලධාරීන්ට නවාතැන් පහසුකම් සැපයීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.754,327 ක් වැය කර තිබුණි.

(ආ) පවත්නා සෘජු දුරකථන මාර්ග අඩු කිරීම මඟින් නිල දුරකථන ගාස්තු අඩු කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් 2011 ජනවාරි මාසයේදී ඉන්ටර්කොම් පහසුකම් ස්ථාපනය කර තිබුණි. කෙසේ වුවද බැහැරට ගන්නා ඇමතුම් පහසුකම්ද ඉන්ටර්කොම් මාර්ග හරහා ලබා ගැනීම හේතුවෙන් හා බැහැර දුරකථන ඇමතුම් පිළිබඳ පාලනයක් නොමැතිවීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ දුරකථන ගාස්තු රු.5,098,617 කින් හෙවත් සියයට 20 කින් වැඩිවී තිබුණි.

**4.3 කළමනාකරණ දුර්වලතා**

**------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යත්ව මත විදේශගතවූ කථිකාචාර්යවරුන් 81 දෙනෙකු ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු රාජකාරී සඳහා වාර්තා කර හෝ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වී නොතිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කරන ලද කථිකාචාර්යවරුන් 86 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එකතුව රු.82,840,601 ක බැඳුම්කර ගිවිසුම් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) රු.3,150,000 ක පිරිවැයකට විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම උප - කොන්ත්‍රාත් මඟින් සිදුකර ගැනීම සඳහා 2013 නොවැම්බර් 18 දින විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත් කාර්යය 2016 සැප්තැම්බර් 30 දක්වා නිමකර නොතිබුණි. කොන්ත්‍රාත්තුව 2016 ජූලි 31 ට පෙර නිමකළ යුතුව තිබුණද, විෂය පථය හා පිරිවැය විචලනයන් හේතුවෙන් නිම කිරීමේ කාලය අවස්ථා 04 කදී සංශෝධනය කර තිබුණි.

(ඇ) විවිධ වර්ගයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලැබුණු රු.31,440,494 ක මුදලක් අරමුණු කළ කාර්යයන් සඳහා සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණු අතර වෙනත් සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් මාරු කිරීමෙන් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක් වැය නොකළ ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ස්වයං මූල්‍යයන පාඨමාලාවලින් උපයන ලද වැය නොකළ ශේෂ රු.4,360,233 ක් නිසි ගිණුමකට මාරු නොකර විශ්වවිද්‍යාලයේ සංවර්ධන කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණි.

(ඉ) 2004 වර්ෂයේදී ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවන ලද රු.163,653 ක මුදලක් 2016 සැප්තැම්බර් 30 දක්වා විශ්වවිද්‍යාලයට නිරවුල් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවන ලද අත්තිකාරම් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) අත්තිකාරම් පිළිබඳ විධිමත් අධීක්ෂණයක් හා පාලනයක් විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කර නොතිබූ අතර ගෙවීම් පිළිබඳ උපරිම සීමාව තක්සේරු කිරීමකින් තොරව විවිධ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවා තිබුණි. තවද, නිලධාරීන් විසින් එම අත්තිකාරම් නිරවුල් කිරීමේදී සැලකිය යුතු කාල ප්‍රමාදයන් තිබූ බව නිරීක්ෂණය විය.

(උ) දිගු ගමන් නිම කිරීමෙන් පසුව විවේකයක් ගැනීමට රියදුරන්ට ඉඩ නොලැබීම හේතුවෙන් අවස්ථා කිහිපයකදී විශ්විවිද්‍යාලයට අයත් මෝටර් වාහන අනතුරු වලට මුහුණ පා තිබුණි. මෙම කරුණ උපකුලපතිවරයාගේම රියදුරන් විසින් දන්වා තිබුණද, මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඌ) විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල් ගෙවීම් රු.1,244,382 ක් විශ්විවිද්‍යාලයේ නිලධාරීන්ට වර්ෂ කිහිපයකදීම ගෙවා නොතිබුණි. නිලධාරීන්ගේ අර්ථ සාධක අරමුදල් ආපසු ගෙවීම සඳහා කළමනාකරණය විසින් මේ සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(එ) කායික අධ්‍යාපන ඩිප්ලෝමාව, පුවත්පත් කලාව පිළිබඳ ඩිප්ලෝමාව, ව්‍යාපාර පරිපාලන විද්‍යාපති පාඨමාලාව, දෙමළ භාෂාව- විද්‍යාපති පාඨමාලාව, "Saiva Siddhanta" විද්‍යාපති පාඨමාලව, පාරිසරික කළමනාකරණය පිළිබඳ දර්ශනපති පාඨමාලාව, සෞඛ්‍ය කළමනාකරණය පිළිබඳ දර්ශනපති පාඨමාලාව, දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම

පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව යනාදී ස්වයං මූල්‍යායන පාඨමාලා පැවැත්වීමේදී සමාලෝචිත වර්ෂය තුළ රු.4,915,577 ක පාඩුවක් දරා තිබුණි. පවත්වන ලද එක් එක් පාඨමාලාවේ අවම වශයෙන් පිරිවැය ආවරණය කර ගැනීමට හෝ විශ්වවිද්‍යාලය විසින් මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**4.4 පුස්තකාල පරිපාලනය**

**-----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුස්තකාලයෙන් පොත් ලබා ගන්නා ලද අධ්‍යයන කාර්ය මණ්ඩලය හා සිසුන් 17 දෙනෙකු විසින් පොත් 31 ක් නියමිත කාල පරිච්ඡේදය තුළ ආපසු භාරදී නොතිබුණි. එම පොත් ආපසු ලබාගැනීම සඳහා මේ සම්බන්ධයෙන් කිසිදු විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. විශ්වවිද්‍යාලය විසින් ප්‍රමාදයන් සඳහා දඩ මුදලක් නොපැනවීම හේතුවෙන් මෙම පොත් වර්ෂයකට වැඩි කාලපරිච්ඡේදයක් හිඟ හිට තිබුණි.

(ආ) නියමිත කාල පරිච්ඡේදය තුළදී වාර සඟරා සැපයීම පිළිබඳ දුර්වල පාලනය හේතුවෙන් මිලදී ගන්නා ලද රු.136,535 ක් හා එජඩො 15,102 ක් වටිනා වාර සඟරා 2015 වර්ෂයේදී ලැබී නොතිබුණි. නියමිත කාල පරිච්ඡේදය තුළ වාර සඟරා නොසැපයීම සම්බන්ධයෙන් කිසිදු විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

**----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 සිට 2013 මාර්තු දක්වා කාල පරිච්ඡේදය තුළ එකතුව රු.1,572,450 ක් වූ ගෙවීම් වවුචර් 20 ක් මඟින් මිලදී ගන්නා ලද පොත් සහ වාර සඟරා සඳහා එම විෂයයන් ලැබීමෙන් තොරව ගෙවීම් කර තිබූ හෙයින් එය වංචා සහගත ගෙවීමක් විය. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන්ගෙන් අදාළ ගෙවීම අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. තවද මෙම ගෙවීම, පොත් හා වාර සඟරා පාඩු අවිනිශ්චිත ගිණුමට ජර්නල් සටහනක් මඟින් මාරු කර තිබූ අතර අභ්‍යන්තර හා බාහිර විමර්ශනයන් සිදුකරමින් පැවතුණි.

(ආ) හෙද ඒකකයේ සම්බන්ධීකාරක විසින් රු.104,220 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත කර තිබුණි. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් පාඩුවේ වගකීම නියම කර තිබූ අතර පාලක සභාවේ තීරණය පදනම් කර ගෙන අදාළ නිලධාරියාගෙන් රු.115,800 ක් වූ සම්පූර්ණ ආදේශක පිරිවැය අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද එම පාඩුව 2016 සැප්තැම්බර් 30 වන විටත් එම නිලධාරියාගෙන් අයකර නොතිබුණි.

(ඇ) සංගීත දෙපාර්තමේන්තුවේ ඩිජිටල් ඉගෙනුම් ලේඛනාගාරයේ තබා තිබූ රු.140,000 ක් වටිනා පරිගණක දෙකක් 2014 අප්‍රේල් 28 දින සොරකම් කර තිබුණි. මෙම කරුණ සම්බන්ධයෙන් මූලික විමර්ශනය සිදුකිරීම සඳහා උපකුලපතිවරයා විසින් නිලධාරීන් දෙදෙනෙකු නම්කර තිබුණි. කෙසේ වුවද මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව මූලික විමර්ශනය සිදුකිරීම සඳහා වගකිව යුතු නිලධාරින් විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රදාන ප්‍රතිපාදන යටතේ කෘෂිකර්ම පීඨයට නිකුත් කරන ලද පීඨාධිපතිගේ කාර්යාලයට අයත් රු.98,700 ක් වටිනා මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරය දෙවැනි වසර දේශන ශාලාවෙන් 2015 පෙබරවාරි 13 වන විට අස්ථානගතව තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව හානිය සම්බන්ධයෙන් මාසයක් ඇතුළත වාර්තා කිරීමට කෘෂිකර්ම පීඨාධිපතිවරයාට නොහැකිවී තිබුණි. 2015 අගෝස්තු 08 දින පාලක සභාව විසින් මූලික

විමර්ශන සඳහා නිලධාරීන් පත්කර තිබුණද, පාඩුව අයකර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් 2016 සැප්තැම්බර් 30 දක්වා කිසිඳු අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) 2015 අගෝස්තු 07 දින මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරයක් විද්‍යා පීඨයේදී නැතිවී තිබුණි. මේ සම්බන්ධයෙන් පාඩුව අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ඊ) වෛද්‍ය පීඨයේ පීඨාධිපති කාර්යාලයට අයත් පා පැදියක්, පාපැදි ගාල් කරන ස්ථානයේදී 2014 නොවැම්බර් 04 දින අස්ථානගතවී තිබුණද, මුදල් රෙගුලාසි 103 හා 105 ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 4.6 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු 148 ක් පිරවීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ පීඨ 7 ක මහාචාර්ය, සහාය මහාචාර්ය යනාදි ප්‍රධාන අධ්‍යයන තනතුරුවල පුරප්පාඩු 117 ක් පැවතුණි. කෙසේ වුවද මෙම පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21 වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය විසින් පත්කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයන් 683 දෙනෙකුගේ අධ්‍යාපනික සහතික සනාථ කර ගැනීම් වර්ෂ කිහිපයක සිට විශ්වවිද්‍යාලය විසින් අදාළ ආයතන වලින් ලබා ගෙන නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරුවල රාජකාරී සඳහා පුහුණුවන කළමනාකරණ සහකාරවරුන් 30 දෙනෙකු යොදවා තිබුණි. කෙසේ වුවද, අනධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථිර තනතුරු සඳහා පත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 4.7 භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාපැදි, යූපීඑස්, දේශන ශාලා පුටු හා කැරකෙන පුටු ආදී විෂයයන් 131 ක ඌනතාවයක් සහ මයික්‍රෝ වේව් උපකරණ, කියවීම් පුටු, යූපීඑස්, පරිගණක හා පරිගණක පුටු යනාදි විෂයයන් 60 ක අතිරික්තයක් 2014 වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩලය විසින් වාර්තා කර තිබුණි. කෙසේ වුවද, මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව, භාණ්ඩ සමීක්ෂණය මඟින් වාර්තා කරන ලද පරිදි ඒ සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ඉංජිනේරු පීඨයේ පරිගණක ඒකකයේ භාවිතය සඳහා රු.257,600 කට විශ්වවිද්‍යාලය විසින් මිලදී ගන්නා ලද බාල තත්ත්වයේ පරිගණක පුටු 50 ක් පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පැවතුණි. කෙසේ වුවද මෙම විෂයයන් පිළිබඳව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට ඔවුන්ගේ වාර්තාවේ වාර්තා කිරීමට නොහැකිවී තිබුණි. තවද පාවිච්චි කළ නොහැකි පුටු වෙනුවට වෙනත් පුටු ආදේශ කිරීම සඳහා විශ්වවිද්‍යාලය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 4.8 මතභේදයට තුඩුදෙන කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සියලුම කාර්ය මණ්ඩලය තම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතුය. කෙසේ වුවද නිලධාරීන් ඔවුන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2014 අගෝස්තු 22 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කමිටුව විසින් විශ්වවිද්‍යාලයට අනුයුක්ත සියලු කාර්ය මණ්ඩලය විසින් රීති හා රෙගුලාසි අනුගමනය කළ යුතු බවටත් එසේම ඒ අනුව කටයුතු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට / ගණන්දීමේ නිලධාරියාටද නියෝග කර තිබුණි. කෙසේ වුවද එම නියෝගය විශ්වවිද්‍යාලය විසින් මේ දක්වා අනුගමනය කර නොතිබුණි.

(ආ) නිලධාරින් විසින් ලබාගන්නා ලද නිවාඩු වලින් බොහොමයක් වගකිව යුතු නිලධාරීන් විසින් අනුමත නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදය ප්‍රකාරව නිවාඩු සම්බන්ධයෙන් පරිපාටි අනුගමනය කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකිවී තිබුණි. තවද, නිලධාරීන් විසින් සුදුසු වැඩ බැලීමේ ක්‍රියාමාර්ග නොමැතිව නිවාඩු ලබාගෙන තිබූ අතර, ඒ අනුව හදිසි වැඩ අනෙකුත් නිලධාරීන් විසින් සිදුකර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2010 පෙබරවාරි 15 දිනැති අංක 02/2010 දරන ආයතන චක්‍රලේඛය ප්‍රකාරව, 2011 වර්ෂය තුළදී මිලදී ගන්නා ලද රු.779,520 ක් වටිනා ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍ර 12 ක් විශ්වවිද්‍යාලයේ සියලු අංශවල ඵලදායී ලෙස ස්ථාපනය කර නොතිබුණි.

## 4.9 ප්‍රසම්පාදන පරිපාටියට අනුකූලවීම

සමාලෝචිත වර්ෂය තුළ කාර්යාලීය ලී බඩු හා උපකරණ, ගොඩනැගිලි, පොත් හා වාර සඟරා, උපාධි ලෝගු, දුරකථන හුවමාරු පද්ධති හා ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.921,180,776 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1 වගන්තියට අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.1(ආ) වගන්තිය අනුව, අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තුගත කළ යුතුය. කෙසේ වුවද විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන කාර්යයන් ලැයිස්තු ගත කර තිබුණි.

(ඇ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ අංක 07 සිට අංක 13 දක්වා සඳහන් කරන ලද විෂයයන් සඳහා නිම කිරීමේ ඉලක්ක දිනයන් දක්වා නොතිබුණි.

(ඈ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.2 වගන්තිය අනුව, කාල ක්‍රමානුගත ක්‍රමයකට හා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිට නිම කිරීම දක්වා පියවරයන් විස්තර කරමින් ප්‍රසම්පාදන කාල උපලේඛනයක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද කාල උපලේඛනය හා එක් එක් ප්‍රසම්පාදන කාර්යයේ පියවරයන් විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කර නොතිබුණි.

**4.10. වත්කම් කළමනාකරණය**

**4.10.1 නිෂ්කාර්ය වත්කම්**

වටිනාකම රු.361,850 ක් වූ ඉටි පන්දම් , ද්‍රව්‍ය නාමාවලි කාඩ්පත්‍ර හා ඉන්ක් කාට්රිජස් (Ink Cartridges) ආදී පාරිභෝගික හා නඩත්තු විෂයයන් වර්ෂ 1 සිට වර්ෂ 15 දක්වා කාල පරිච්ඡේදයක් උපයෝජනය කිරීමෙන් තොරව විශ්වවිද්‍යාලයේ ගබඩාවේ තබා තිබුණි. ඒවා උපයෝජනය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

**4.10.2 මෝටර් වාහන කළමනාකරණය**

මෝටර් වාහන නඩත්තු කිරීම පිළිබඳව පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

* ඉන්ධන ඇණවුම් අංකය, ඉන්ධන බිල්පත්‍රවල දිනය හා අංක දෛනික සටහන්වල ඇතුළත් කර නොතිබුණි.
* ගමන්වල අරමුණ දෛනික සටහන්වල සඳහන් කර නොතිබුණි.
* වාහන වල ලොග් පොත් විධිමත්ව යාවත්කාලීන කර නොතිබුණි.
* කිලෝමීටර් 4260 ක ගමන් සඳහා වාහන උපයෝජනය කිරීමෙන් පසුව ධාවන සටහන්වල අත්සන් තැබීම නිලධාරීන් විසින් සිදුකර නොතිබුණි.
* මෝටර් වාහන සංචලන ලේඛනයක් පවත්වා නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව, 2013 හා 2014 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2016 සැප්තැම්බර් 30 දක්වාත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපිය අනුව, විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් හා වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන ඒකකය විසින් පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන වැඩ සටහන මඟින් පහත සඳහන් ගනුදෙනු ක්ෂේත්‍ර ආවරණය කර නොතිබුණි.

(අ) වාහන අනතුරු
(ආ) වත්කම් පාඩු
(ඇ) පෞද්ගලික ලිපිගොනුවල අඩංගු ලියකියවිලි

**5.4 පිළිතුරු නොලත් විගණන විමසුම්**

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නිකුත් කරන ලද විගණන විමසුම් 11 කට පිළිතුරු සැපයීම සඳහා විශ්වවිද්‍යාලය පියවර ගෙන නොතිබුණි.

## 5.5 අයවැය පාලනය

------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන  අඩුපාඩු විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. ස්ථාවර වත්කම් පාලනය කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.